# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

11 ශ්‍රේණිය

## නාට්‍යය හා රංග කලාව - II

නම/ විභාග අංකයඃ .........................................   කාලය ;- පැය 2යි

✶ **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

01) දික්තල කාලගෝල නාට්‍ය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. මෙම නාට්‍ය ප්‍රථම වරට රඟ දැක්වූ වර්ෂය හා ස්ථානය ලියන්න. (ල 2)

ii. නව නාට්‍යයේ නිෂ්පාදකවරයා කවුරුන්ද? (ල 2)

iii. මෙම නාට්‍යයේ අභිනයෙන් දැක්වෙන රංග භාණ්ඩයක් නම් කරන්න. (ල 2)

iv. මෙම නාට්‍යයේ පූර්ව රංගනය යටතේ ඉදිරිපත් කෙරෙන අංගය කුමක්ද? (ල 2)

v. දික්තලාගේ මවගේ සහ පියාගේ නම් මොනවාද? (ල 2)

vi. දික්තලා හා කාලගෝල යන දෙදෙනා එකිනෙකා සමඟ නොගැලපීමට හේතුවන කරුණු දෙකක් ලියන්න. (ල 2)

02)

i. රංගාලෝකය සඳහා භාවිතා කරන පහන් වර්ග දෙකක් හා උපකරණ දෙකක් නම් කරන්න. (ල 2)

ii. අතීතයේ භාවිතා කළ රංගාලෝක උපක්‍රම පැහැදිලි කරන්න. (ල 4)

iii. නාට්‍යයක් රඟ දක්වන අවස්ථාවේ දී රංගාලෝකය මගින් ඊට සිදුවන මෙහෙය විස්තර කරන්න. (ල 6)

03) ප්‍රොසීනියම් රංගභූමියේ භූගෝලීය බෙදීම් මෙන්ම දෘෂ්ටිරේඛාව ද මනඃකල්පිතය.

i. රංගභූමිය කොටස් කීයකට බෙදා දැක්වේද? (ල 2)

ii. එම බෙදීම් රූප සටහනක ඇඳ දක්වන්න. (ල 4)

iii. රංගභූමිය ප්‍රායෝගිකව භාවිතා කිරීමේදී දැකගත යුතු කරුණු හයක් ලියන්න. (ල 6)

04)

i. ප්‍රාසාංගික කලාව යන්න නිර්වචනය කරන්න. (ල 2)

ii. නාට්‍යහැර සෙසු ප්‍රාසාංගික කලා හතරක් නම් කරන්න. (ල 4)

iii. සෙසු ප්‍රාසාංගික කලාවකට වඩා නාට්‍යකලාවෙහි ඇති විශේෂත්වය පැහැදිලි කරන්න. (ල 6)

05)

i. සොකරි රඟදැක්වෙන ප්‍රදේශ දෙකක් නම් කරන්න. (ල 2)

ii. සොකරි ගැමි නාටකයේ ඇතුළත් වන ප්‍රධාන චරිත හතරක් සඳහන් කරන්න. (ල 4)

iii. සොකරි ගැමි නාටකයේ රංග ශෛලිය විස්තර කරන්න. (ල 6)

06)

i. නාඩගම් ශිල්පීන් දෙදෙනෙක් හා ඔවුන්ගේ නිර්මාණ දෙක බැගින් ලියන්න. (ල 2)

ii. නාඩගම් පූර්ව රංගනයේ දැකගත හැකි ස්ථාවර පාත්‍රයන් හතරක් නම් කරන්න. (ල 4)

iii. නාඩගම් රංගශෛලියට අයත් කරුණු හයක් ලියන්න. (ල 6)

07) පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කරගෙන ඒකාංක නාට්‍යයක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කර ගත හැකිය.

මෙවර අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි චාමර අගනුවර ප්‍රධාන පාසලක ඉගෙන ගන්නා ඉතා දක්ෂ ශිෂ්‍යයෙකි. මව ගුරුවරියක් වන අතර චාමරගේ පියා වෛද්‍යවරයෙකි. ඔහුගේ පියාගේ එකම බලාපොරොත්තුව තම පුතා වෛද්‍යවරයෙකු වනු දැකීමයි. දෙමාපියන් මෙන්ම ගුරුවරුන් ඇතුළු සියලුදෙනා බලාපොරොත්තුවෙන් සිටින්නේ චාමර A සාමාර්ථ 9ක් සහිතව අ.පො.ස. (සා.පෙළ) සමත් වෙතැයි සිතාය. ප්‍රතිඵල නිකුත් වූ බව දැනගන්නා චාමර වහා තම ප්‍රතිඵලය බැලීමට උත්සුක වේ. එක්වරම ඔහු පපුව අල්ලාගෙන කෑ ගසමින් බිම ඇද වැටේ.

1. අවශ්‍ය පරිදි රංග විධාන සමඟ සංවාද රචනා කිරීම සඳහා (ල 2)
2. චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ල 4)
3. කුතුහලය දනවන නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ල 6)